EDCS

ආරම්භය: 1930 ලි.අ. අංකය: 736
ஆரம்பம்: 1930 பதிவு இல: 736
Inception: 1930 Reg. No: 736

# සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය

# තනතුරු පුරප්පාඩු

සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතු වූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියාකරනු ලබන සමුපකාර සමිතියකි.

මෙම සමිතියේ පුරප්පාඩු වී ඇති සහකාර ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක, පුහුණු කිරීමේ නිලධාරී සහ කළමනාකරණ සහකාර යන තනතුරු සඳහා කුසලතා පූර්ණ උද්‍යෝගිමත් සහ කැපවීමෙන් යුතුව වැඩ කිරීමේ හැකියාව ඇති අදාළ සුදුසුකම් සැපිරූ අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර ගණකාධිකාරී - E.3.2.1 (විධායක ශ්‍රේණිය III වන පන්තිය)

**සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජ/ මූල්‍ය කළමනාකරණ/ ගණකාධිකරණ යන ක්ෂේත්‍රයේ උපාධියක් හෝ වරලත් ගණකාධිකරණ ආයතනයේ අන්තර් මධ්‍ය අදියර සමත්වීම හෝ වරලත් ගණකාධිකාරීන්ගේ කළමනාකරණ ආයතනයේ CIMA අවසන් අදියර සමත් වීම සමඟ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 2 ක පළපුරුද්ද

**හෝ**

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක ගණකාධිකරණ ඩිප්ලෝමාව සමඟ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 3 ක පළපුරුද්ද

**හෝ**

- ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ AAT අවසන් අදියර සමත්වීම සමඟ පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 4 ක පළපුරුද්ද

**හෝ**

- පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමඟ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 6 ක පළපුරුද්ද

**හෝ**

- ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන උසස් පෙළ සාමාර්ථය සමඟ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 7 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය : මාසික 29,900 - 475 X 10 - 500 X 10 - 39,650/-

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

## කළමනාකරණ සහකාර - 0.1 (මෙහෙයුම් ශ්‍රේණිය III වන පන්තිය)

**සුදුසුකම්**

- අ.පො.ස උසස් පෙළ සාමාර්ථය සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස සාමාන්‍ය පෙළ ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් හතරකට සම්මාන තිබීම

**හෝ**

- ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 05 කට සම්මාන සහිතව අ.පො.ස සාමාන්‍ය පෙළ සමත්වීම සහ ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සාමාන්‍ය පෙළ සාමාර්ථය සමග පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසරක පළපුරුද්ද

**හෝ**

- කාර්යාල කළමනාකරණ විෂයට සම්මාන සහිතව ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සාමාන්‍ය පෙළ සාමාර්ථය සමඟ පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසර 02කට නොඅඩු පළපුරුද්ද

**හෝ**

- කාර්යාල කාර්ය සහායක තනතුරේ I පන්තියේ වසර 05 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය : මාසික 21,700 - 250 X 10 - 275 X 10 - 26,950/-

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ, සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

## අභ්‍යන්තර විගණක - E.3.3.1 (විධායක ශ්‍රේණි III වන පන්තිය)

**සුදුසුකම්**

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ අන්තර් මධ්‍ය අදියර සමත්වීම.

**හෝ**

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයක ගණකාධිකරණ ඩිප්ලෝමාව සමග පිළිගත් ආයතනයක ගිණුම් හෝ විගණන ක්ෂේත්‍රයේ තනතුරක වසරක පළපුරුද්ද.

**හෝ**

- ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ AAT අවසන් අදියර සමත්වීම සමග පිළිගත් ආයතනයක ගිණුම් හෝ විගණන ක්ෂේත්‍රයේ තනතුරක වසර 02 ක පළපුරුද්ද.

**හෝ**

- පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ විගණක ඩිප්ලෝමාව සමග පිළිගත් ආයතනයක ගිණුම් හෝ විගණන ක්ෂේත්‍රයේ තනතුරක වසර 03 ක පළපුරුද්ද.

**හෝ**

- ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය විසින් පවත්වන සමුපකාර සංවර්ධන උසස් පෙළ සමග පිළිගත් ආයතනයක ගිණුම් හෝ විගණන ක්ෂේත්‍රයේ තනතුරක වසර 05 ක පළපුරුද්ද.

**හෝ**

- කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ ගිණුම් හෝ විගණන අංශයට අදාළව වසර 05 ක පළපුරුද්ද.

වැටුප් පරිමාණය : මාසික 28,700 - 425X10-450X10 - 37,450/=

ඉහත මාසික වැටුපට අමතරව රු. 17,800/= ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමිවේ.

## පුහුණු කිරීමේ නිලධාරී - E.3.2.1 (විධායක ශ්‍රේණිය III වන පන්තිය)

- පිළිගත් විශ්වවිද්‍යාලයක මානව සම්පත්/ කළමනාකරණය/ සමාජ විද්‍යා යන ක්ෂේත්‍රයේ උපාධියක් සමග පිළිගත් වානිජ/ කාර්මික ආයතනයක පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද.

**හෝ**

- පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද

**හෝ**

- ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන උසස් පෙළ සමග පිළිගත් වාණිජ/ කාර්මික පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ වසර 06 ක පළපුරුද්ද.

වැටුප් පරිමාණය : මාසික 29,900 - 475X10 - 500X10-39,650/=

ඉහත මාසික වැටුපට අමතරව රු. 17,800/= ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමිවේ.

**පොදු කොන්දේසි**

- අයදුම්කරුවන් වයස අවු.18 ත් 45 ත් අතර විය යුතුය.
- ජීවදත්ත සහිත සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද ඇතුළත්ව තමා විසින්ම සකස් කළ අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළයුතු අතර, දැනටමත් ඔබ සමුපකාර සමිතියක සේවයකරයි නම් අදාළ අයදුම්පත්‍රය එම සමුපකාර සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය.
- මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිත වන අතර, තෝරාගනු ලබන අයගේ වැටුපෙන් 10% ක්ද, ආයතනයෙන් 15% ක්ද සමඟ සේවක අර්ථසාධක අරමුදලට බැරකරනු ඇත.
- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලබන අතර, පාලක මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
- සහකාර ගණකාධිකාරී අභ්‍යන්තර විගණක, පුහුණු කිරීමේ නිලධාරී සහ කළමනාකරණ සහකාර යන තනතුරු සඳහා තෝරාගනු ලබන අය සමිතියේ ඕනෑම දිස්ත්‍රික් කාර්යාලයක සේවය කිරීම සඳහා එකඟ විය යුතුය.
- තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද දැක්වෙන සහතිකවල සහතික කළ පිටපත්ද, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක්ද සමඟ අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2024-06-29 දින දහවල් 12.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.


ප්‍රධාන සභාපති
සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,
අංක294, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංකය : 011 2370717 ෆැක්ස් : 0112577475